**නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මත කරගැනීම සඳහා වන ප්‍රයත්නය සම්බන්ධයෙන් රට තුළ මතුව ඇත්තේ මහත් විවාදයකි. එක් පාර්ශ්වයක් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මත කරගැනීමේ අවශ්‍යතාව අවධාරණය කරන අතර තවත් පාර්ශ්වයක් නව ව්‍යවස්ථාවක් සම්මත කරගැනීම සඳහා දරන උත්සාහය කොන්දේසි විරහිතව පරාජය කළ යුතු ප්‍රයත්නයක් බව ප්‍රකාශ කරයි. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දේශපාලන විද්‍යා අධ්‍යන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය ශාන්ත ගම්ලත් මහතා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක අවශ්‍යතාව සහ එහිළා ජයගත යුතු අභියෝග පිළිබඳ මෙසේ කරුණු දක්වයි.**



## නැවුම් දේශපාලන වෙනසක් සඳහා

# නව ව්‍යවස්ථාවක අවශ්‍යතාව

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දේශපාලන විද්‍යා අධ්‍යන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,**

**ආචාර්ය ශාන්ත ගම්ලත්**

### නව ව්‍යවස්ථාවක අවශ්‍යතාව

ලෝකයේ ඕනෑම, ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් සහිත රටක ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණය යන ආයතන තුනක් ස්ථාපිත කොට, ඒවා එකිනෙකින් සමතුලිත කොට තිබේ. යහපත් ආණ්ඩුකරණයක් සඳහා එය මූලික අවශ්‍යතාවකි. එහෙත් පසුගිය කාලයේ අප රටේ දැකගත හැකිවූයේ විධායකය විසින් අධිකරණය යටපත් කරන්නට දරන උත්සාහයන්ය. ව්‍යවස්ථාදායකය අධිකරණය ප්‍රශ්න කරනු දක්නට ලැබිණ. එසේ සිදුවන විට අධිකරණයක් ස්වාධිනව පවත්වා ගත නොහැකිය.

එලෙස එක් පැත්තකින් අධිකරණයේ ස්වාධීනත්වය බිඳ වැටෙන අතර තවත් පැත්තකින් පාර්ලිමේන්තුවේ විනය අන්තයටම පිරිහුණි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ වගන්තිවල තිබූ දුර්වලතාවයන් නිසා පුද්ගලයන් විෂමාකාරව හැසිරෙන්නට වූහ. ඒ අතර විධායකය ව්‍යවස්ථාපිත ඒකාධිපතිත්වයක් දෙසට ගමන් කරන්නට විය. 18 වෙනි ව්‍යවස්ථා සංශෝධනයෙන් රටට යාවජීව පාලකයෙක් ගෙන එන්නට කළ උත්සාහය එය ඉතා හොඳින් ප්‍රකට කළ අවස්ථාවක් විය. යාවජීව රාජ්‍ය පාලකයන් පත්වීම රාජාණ්ඩු ක්‍රමයක ලක්ෂණයකි. එවැනි සමාජ කිසි විටකත් සිවිල් සමාජ වන්නේ නැත. සිවිල් සමාජයක ජනතාව නිදහස් පුරවැසියන්ය. මෑත අතීතයේ අප රටේ දක්නට ලැබුණේ පුරවැසියන් නොව යටත් වැසියන්ය. පාලකයන්ගේ හැසිරීමෙන් පවා ප්‍රකට වුයේ නොනිල රාජාණ්ඩු ක්‍රමයකට යන ගමනකි. මෙලෙස රටේ ප්‍රජාතන්ත්‍රවාදය බලවත් අර්බුධයකට යාමට පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රධාන හේතුවක් ලෙස හඳුනාගත හැකිවිය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් යනු රටේ මූලික නීති ලියැවිල්ලය. නිවෙසක් ගොඩනැගීමකදී එහි සැළැස්ම වැනිය. සැළැස්ම නිවැරදි නොවූයේ නම් ඒ නිවෙස සැමදාම කඩා කඩා පවතින කෑලි ඉවත් කරමින්ද, අලුතින් කෑලි එක්කරමින්ද නැවත නැවත හදන්නට සිදුවීමේ ශාපයට ලක්වේ. එවැනි නිවෙසක් මිනිස් වාසයට යාදින්නේ නැත. රාජ්‍යයක් ගොඩනැගීමේදීද මේ කාරණය එසේමය. රාජ්‍යයේ මූලික ව්‍යුහය පිළිබඳ සැකසුණු මනා සැළැස්මකින් තොරව ගොඩනඟන රාජ්‍යයට අත්වන්නේද මනා සැළැස්මක් නොමැතිව ඉදිකරන නිවෙසකට අත්වන ඉරණමමය. රාජ්‍යයේ මූලික ව්‍යුහය දැක්වෙන සැළැස්ම වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවය. එබැවින් මනා රාජ්‍යයක් ගොඩනැඟීම මනා ව්‍යවස්ථාවක් මත රඳා පවතී. වර්තමානයේ බලාත්මක 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පර්යේෂණ මට්ටමේ එකකි. 78 වසරේදී අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මත කරගන්නේ රට තුළ දේශපාලන ප්‍රතිසංස්කරණ ඇති කිරීමේ අරමුණකින් නොවේ. අලුත් ආර්ථික මොඩලයකට අවශ්‍ය දේශපාලන විධායකයක් ඇති කිරීමේ අරමුණෙනි. ජේ.ආර්. ජයවර්ධන 78 ව්‍යවස්ථාවෙන් බලාපොරොත්තු වුවේ ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමට වඩා ආර්ථිකය ශක්තිමත් කිරීමය. 78 ව්‍යවස්ථාවෙන් විධායක ජනාධිපති ක්‍රමයක් රටට හඳුන්වා දුන්නේ ඒ සඳහාය. කවුරුන් සඳහාද ?

1978 සහ 2017 අතර ගතව ඇති කාලය වසර හතලිහක් පමණ දීර්ඝය. ඒ කාලය තුළ විශාල සමාජ පරිවර්ථනයන් සිදුව ඇති අතර සමාජ අවශ්‍යතාවලද ලොකු වෙනසක් සිදුව තිබේ. ඒ සියල්ල සැළකිල්ලට ගෙන නව රාජ්‍ය පාලන ව්‍යුහයක් සකසා ගැනීම නව ව්‍යවස්ථාවකින් අපේක්ෂිතය. මෙහිදී සිදුවිය යුත්තේ විවිධ පුද්ගලයන්ගේ හෝ කණ්ඩායම්වල හෝ දේශපාලන පක්ෂවල හෝ අවශ්‍යතා ඉටු කරගැනීම සඳහා වන නව ව්‍යවස්ථාවක් සම්මත කරගැනීම නොව රටේ සහ ජනතාවගේ සැබෑ අවශ්‍යතාවයන් ඉටු කරගැනීම සඳහා වන ව්‍යවස්ථාවක් සම්මත කරගැනීමය.



**සාකච්ඡා කළේ**

**ශ්‍රීලාල් සෙනෙවිරත්න**

නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙන ආ යුතු බව කියන පාර්ශ්වයන් ඒ සඳහා මුල්වෙන ඔවුන්ගේ සැබෑ දේශපාලන අභිලාෂය කුමක්දැයි ජනතාවට හෙළි කළ යුතුය. මේ රටට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අවශ්‍ය ඇයි ? කියන කාරණය ඔවුන් නිර්වචනය කරගන්නේ කෙසේද යන්න ජනතාව දැනගත යුතුය. එහිදි සැඟවුණු න්‍යාය පත්‍ර කිසිවක් හෝ තිබිය නොහැකිය. මෙහිදී ජනතාවට එකඟ විය හැක්කේ බහුත්ව ප්‍රජාතන්ත්‍රවාදය සඳහා බලය බෙදීමට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අවශ්‍යය බව කියන පාර්ශ්වයන් සමඟය.

'බහුත්ව ප්‍රජාතන්ත්‍රවාදය' යනු සියලු පාර්ශ්වයන්ගේ සහභාගිත්වයෙන් සිදුවන ප්‍රජාතන්ත්‍රවාදයයි. සමහර රටවල සමාජය ඒකීය ය. විවිධ ජනවර්ග නැත. එක ජනවර්ගයක් පමණක් සිටිති. සමහර රටවල ජනවර්ග ගණනාවක් සිටිති. ඒවා සංස්කෘතික විවිධත්වයෙන් යුත් සමාජයන්ය. ඒවායේ දේශපාලනයද එකී බහුවිධතාවයට ගැලපෙන ආකාරයෙන් සකස් විය යුතුය. ආණ්ඩුව ඒකීයද?, සන්ධීයද? යන කාරණයට කලින් බහුත්ව ප්‍රජාතන්ත්‍රවාදය යන කාරණය මතු කොට ගත යුතුය.

### බලය බෙදීම

බලය බෙදීම යන කාරණයේදී සියලු පාර්ශ්වයන්ට කැප කිරීම් කරන්නට සිදුවේ. මගේ නිරීක්ෂණය වන්නේ බලය බෙදීම සම්බන්ධයෙන් දෙපාර්ශ්වයේම දේශපාලන නායකයන්ට ඇත්තේ මානසික ප්‍රශ්නයක් බවය. එය කඩන්නේ කෙසේද යන්න අප මුහුණ දෙන ප්‍රශ්නයයි.
පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට ඇති මෙහෙයුම් කමිටු යෝජනා මාලාවේ බලය බෙදීමේ ඒකකය පළාත් සභා ලෙස දක්වා තිබේ. එය සුදුසුය. මේ රටේ 1987 සිදුවූ 13 ව්‍යවස්ථා සංශෝධනයෙන් අර්ධ සන්ධීය ක්‍රමයට ගිය බලය බෙදීමක් සිදුවිය. එහිදි විෂයන් 38ක් ක්‍රියාත්මක කිරීමේ බලය පළාත් සභාවන්ට පැවරුණි. එය ඉතා හොඳ බලය බෙදීමකි. එහෙත් එය එලෙසින්ම ක්‍රියාත්මක කළේ නැත. පළාත් සභාවලට පොලිස් බලතල දුන්නේ නැත. ඉඩම් බලතල දුන්නේද නැත. ඒ දෙකත් දී උපරිම ශක්තිමත් කළ යුතුව තිබිණ.

එහෙත් පළාත් ඒකාබද්ධ කිරීම සම්බන්ධයෙන් ප්‍රශ්නයක් මතුවේ. යුරෝපයේ ඒකීය රාජ්‍ය ගොඩනැගෙන්නේ එක ජාතියකට එක රාජ්‍යයක් යන සංකල්පය පදනම් කරගෙනය. එහිදී ප්‍රභල ජාතින් එක්ව ඒකීය රාජ්‍ය ගොඩනඟා ගත්හ. නමුත් පසුව ඒවායේ සිටි සුළු ජාතිකයන් ඔවුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් සටන් කරන්නට විය. ඔවුන්ටත් රාජ්‍යයක් අවශ්‍ය බව ඔවුන්ගේ සටන් පාඨය විය.

ලංකාවේ භූගෝලීය සහ සංස්කෘතික විෂමතා දෙස බලන විට උතුරු පළාත සුවිශේෂීය. එහි පැහැදිලි බහුතරය දෙමළය. එහෙත් නැගෙනහිර පළාත තුළ පවතින්නේ වෙනස් තත්වයකි. එහි සිංහල, දෙමළ, මුස්ලිම් සම සමව මෙන් සිටිති. එම පළාත උතුරු පළාතට ඒකාබද්ධ කිරීම තර්කානුකූල නොවේ. එසේ කිරීම එය මධ්‍යම රජයේ පාලනයෙන් නිදහස් කොට උතුරු පළාතේ පාලනයට නතු කිරීමක් හා සමානය. යම් දිනෙක එය නැවත ප්‍රශ්නයක් ලෙස මතුවීමට ඇති ඉඩ කඩ නොසළකා හැරිය නොහැකිය.

### සුළු පක්ෂ යෝජනා

අතුරු වාර්තාවේ යෝජනා වළ ඇතුළත් සුළු පක්ෂ යෝජනා දෙස බැලීමේදී පෙනී යන්නේද මෙම පළාත් ඒකාබද්ධ කිරීමට එම පක්ෂ අකමැති බවය. ඒවාට ඇහුම්කන් නොදී සිටිය නොහැකිය. මහජාතිය සෑම විටම සුළුතරය ආරක්ෂා කළ යුතුය. හිතාමතාම යම් ජන කොටසක් තවත් ජන කොටසක් යටතට පත්කොට අනාරක්ෂිත කිරීම නොකළ යුතුය.

මේ රටේ පළාත් නවයට 13 සංශෝධනයෙන් ඔබ්බට ගොස් උපරිම ලෙස බලය බෙදිය යුතුය. පළාත් ඒකාබද්ධ කිරීම සම්බන්ධයෙන් මධ්‍යම ආණ්ඩුව ව්‍යවස්ථාව තුළ ප්‍රතිපාදන ඇතුළත් කළ යුතුය. එවැනි ඒකාබද්ධ කිරීමක් කරන්නේ නම් ඒ සඳහා ඒ පළාත් දෙකේ

**20 වන පිටට**